ගලේවෙල ප්‍රාදේශීය සභාව
--------------------------------
මාතලේ දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

**2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 26 දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.**

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ගලේවෙල ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ජංගම වගකීම් රු.742,366 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය මුදල රු.742,366 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (iii) | ලබාගත් ණය සඳහා ගෙවිය යුතු රු.5,089,176 ක පොලී මුදල ගිණුම්ගත කර නොතිබුණි. | ණය පොලී මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (iv) | පොදු අරමුදල් 2019 යටතේ සිදුකරන ලද කර්මාන්ත 17 ක ණයහිමි වටිනාකම් දෙවරක් ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.4,785,566 ක අගයකින් ණයහිමි වැඩියෙන් දැක්වුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | යන්ත්‍ර හා උපකරණ, ලී බඩු හා සවිකිරීම්, පරිගණක හා උපාංග මිලට ගැනීම සඳහා වැයකළ රු.502,743 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (vi) | ගොඩනැගිලි සංවර්ධන කටයුතු සඳහා දරන ලද රු.1,577,736 ක වටිනාකමක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 07 ක වටිනාකම හා එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛනවල ශේෂ අතර රු.114,666,304 ක අසමානතාවයක් විය. | ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කල යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.389,191,073 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළව පිළිගතහැකි සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ වලට අදාළ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉඩම් ගොඩනැගිලි වල නීත්‍යානුකූල හිමිකම් ලබාගැනීමට කටයුතු කරන අතර පුස්තකාල පොත් සඳහා අදාළ උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අදායම රු.15,025,348 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,446,141 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,403,000 | 2,430,966 | 3,114,586 | 1,624,678 | 2,053,000 | 3,454,314 | 2,897,105 | 2,293,101 |
| කුලී | 5,700,000 | 4,321,580 | 4,524,528 | 550,859 | 4,950,000 | 3,227,022 | 3,338,304 | 150,527 |
| බලපත්‍ර ගාස්තු | 4,100,000 | 3,834,280 | 3,829,280 | 691,370 | 3,550,000 | 3,498,715 | 2,807,345 | 691,370 |
| වෙනත් ආදායම් | 22,200,000 | 23,716,987 | 8,598,700 | 15,118,287 | 21,700,000 | 39,552,551 | 17,677,445 | 21,875,109 |
| එකතුව | 34,403,000 | 34,303,813 | 20,067,094 | 17,985,194 | 32,253,000 | 49,732,602 | 26,720,199 | 25,010,107 |

2.2.2 වරිපනම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට බිල්කළ වරිපනම් බදු සහ ඊට පෙර පැවති හිඟ මුදලින් එකතුව සියයට 38 ක ප්‍රමාණයක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වර්ෂ පහෙන් පහට වරිපනම් තක්සේරු කර නොතිබුණි. | වරිපනම් තක්සේරු කර ගැනිම කඩිනමින් සිදුකළ යුතුවේ. | දේපල තක්සේරුවට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ද ලැබී ඇති අතර ඉදිරි කටයුතු සඳහා තක්සේරු දෙපාර්ත මේන්තුව වෙත යොමු කර ඇති බව දන්වමි. |
| (ඇ) | හිඟ වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් අය කළ යුතුවේ. | හිඟ වරිපනම් අය කිරීමට ගතහැකි සියළුම ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වමි. |

2.2.3 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කඩ කාමර වලින් අයවිය යුතු ටෙන්ඩර් ගාස්තු රු.988,025 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ටෙන්ඩර් ගාස්තු කඩිනමින් අයකර ගත යුතු වේ. | ටෙන්ඩර් මුදල අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

2.2.4 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට අක්කර බදු රු.35,333 ක් අයවීමට තිබුණි. | හිඟ අක්කර බදු කඩිනමින් අයකර ගත යුතු වේ. | අක්කර බදු රු.36,201 ක මුදලක් හිඟව පවතින බව දන්වමි. |

2.2.5 ප්‍රචාරන පුවරු වලින් ගාස්තු අයකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අලුතින් සවිකර ඇති ප්‍රචාරන පුවරු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ සිදු කර ගාස්තු අයකළ යුතු වේ. | දැන්වීම් පුවරු 48 කින් රු.706,327 ක මුදලක් අයකරගෙන ඇත. නොගෙවූ දැන්වීම් පුවරු කපා ඉවත් කරන බව දන්වමි. |

2.2.6 පරිසර බලපත්‍ර

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දුම්කොළ උදුන් 41 කට පරිසර බලපත්‍ර ලබාදී ගාස්තු අයකර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබාදීම කළ යුතු වේ. | බලපත්‍ර ලබාදීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |
| (ආ) | කල් ඉකුත් වූ පරිසර බලපත්‍ර 05 ක් නැවත අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර අලුත්කිරීම කළ යුතු වේ. | කර්මාන්ත 02 ක් නතර කර ඇති අතර කර්මාන්ත 03 ක බලපත්‍ර ලබාගැනිමට කටයුතු කර ඇත. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා 11 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදාළ සියළු අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම කළ යුතු වේ. | පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ව්‍යවස්ථා 18 ක් වැළඳගෙන ඇති අතර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවද වැළඳගෙන ඇති බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුර ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 12 ක් සම්බන්ධව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර නොතිබුණි. | සියළු කර්තව්‍යයන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කළ යුතු වේ. | 2020 වර්ෂයේ සිට නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පොදු අරමුදල් - 2019 යටතේ ඉටුකළ යුතුව තිබුණු කර්මාන්ත 03 ක් අවසන් කර නොතිබුණි. | සැලසුම් ප්‍රකාර කර්මාන්ත ඉටුකර ගත යුතු වේ. | එක් කර්මාන්තයක් 2020 මාර්තු වන විට වැඩ නිමකර තිබූ අතර ඉතිරි කර්මාන්ත දෙකේ වැඩ ඉදිවෙමින් පවතින අතර ගෙවීම් කිරිමේදි ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනතුරට පත්වූ කැබ් රථයක් හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(අ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයට අදාළ රක්ෂණ හිමිකම් ලැබී නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන් ගෙන් අලාභය අයකර ගත යුතු වේ. | මු.රෙ 104(1) පරීක්ෂණය සිදු කර අදාළ අලාභය වගකිව යුතු පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 08 ක පුරප්පාඩු 17 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පුරප්පාඩු සඳහා බඳවා ගැනිමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) සේවක ණය | | |
| ස්ථාන මාරු වී ගිය / විශ්‍රාම ගිය නිලධාරින් සිව්දෙනෙකුගෙන් රු.430,781 ක ණය මුදල් අයකර ගෙන නොතිබුණි. | ණය මුදල් නිරවුල් කර ගත යුතු වේ. | ණය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අක්කර 05 පර්චස් 35 ක වහකෝට්ටේ, සියඹලාගහවෙල ප්‍රෙස්ටිජ්ලැන්ඩ් ඉඩම සංවර්ධනය කර විකිණීම සඳහා අනුමැතිය දී නොමැති නමුත් සංවර්ධන සැලසුම් සම්බන්ධයෙන් ඊට අදාළ ආයතනයන්ගෙන් නිර්දේශ ලබා නොගෙන ඉඩම් කට්ටි 15 ක් විකුණා තිබුණි. | අදාළ ආයතනයන් ගෙන් නිර්දේශ ලබා නොගෙන විකුණා ඇති ඉඩම් සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අඩුපාඩු සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලෙස දන්වා සිටි නමුත් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකර ඉඩම් කට්ටි විකිණීම් කටයුතු වහාම නතර කරන ලෙසත් එසේ නොමැති නම් නීතිමය පියවර ගන්නා බවත් දන්වා ලිපි යවා ඇති බව දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ප්‍රජා ශාලා හා සුසාන භූමි ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභාවේ වත්කම් ආරක්ෂා කර ගත යුතු වේ. | මිනුම් කටයුතු කර පවරා ගැනීමට කටයුතු කරමින් පවතින අතර පවරා ගැනීමෙන් පසු වත්කම් ලේඛනයට ඇතුළත් කරන බව දන්වමි. |

### 3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන 09 ක ඉන්ධන දහනය පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | මෙම වාහන අලුත්වැඩියාවෙන් පසු ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීමට නියමිතව ඇති බව දන්වමි. |

### 3.5.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 03 ක් පවරාගෙන නොතිබුණි. | වත්කම් පවරා ගත යුතු වේ. | වාහන පවරා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 3.6 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බැකෝලෝඩර් යන්ත්‍රය 2018 වර්ෂයේ අනතුරකට ලක්ව රු.50,000 කට වැඩි අලාභයක් සිදුව ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව පරීක්ෂණ කටයුතු කර වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. | සභාව විසින් අලාභ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභ අයකර ගත යුතු වේ. | විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |